**ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය - 2023**

**----------------------------------**

## 1 මූල්‍ය ප්‍රකාශන

### 1.1 මතය

ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් සහ අනෙකුත් විස්තීරණ ආදායම් ප්‍රකාශනය, සමුච්චිත අරමුදල් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරුද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1993 අංක 47 දරන ක්‍රීඩා සංශෝධන පනතේ 21අ. යටතේ වූ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

ආයතනයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය ආයතනය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා ආයතනයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරික්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව, ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

### 1.4 විගණන විෂය පථය

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව

විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්,ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවූවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;
- යම් අදාළ ලිඛිත නීතියකට හෝ ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

### 1.5.1 ලැබිය යුතු

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2018 වර්ෂයේ ශ්‍රී ලංකා දකුණු අප්‍රිකානු සංචාරය වෙනුවෙන් ලැබිය යුතු අනුග්‍රාහකත්ව හිමිකම් ආදායම ඇ.එ.ජ.ඩොලර් 187,085 කට සමාන රු. මිලියන 37.5 ක මුදල අයකර ගැනීමේ නෛතික ක්‍රියාමාර්ග අවසන්ව නොතිබුණි. | වාර්තා කරන දිනය වනවිට මෙම මුදල ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය වෙත ලැබී නොතිබුණි. | ලැබිය යුතු මුදල් අප්‍රමාදව අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | දේශීය ආදායම් දෙපාර්තමේන්තුවෙන් ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය වෙත ලැබිය යුතු රු. මිලියන 428.4 ක වැට් බදු ශේෂය දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ තොරතුරු සමඟ සැසඳීම් කර නිරවුල් කර ගැනීමට කටයුතුකර නොතිබුණි. | බදු උපදේශකවරුන්ගේ සහයෝගය ඇතිව අඛණ්ඩවම දේශීය ආදායම් දෙපාර්තමේන්තුවෙන් ඉල්ලීම් කළද මෙතෙක් කිසිදු මුදලක් අය වී නොමැත. ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය මේ සම්බන්ධයෙන් නීත්‍යානුකූල පියවර ගෙන ඇත. | ලැබිය යුතු මුදල් නිරවුල් කර ගැනීමට අප්‍රමාදව කටයුතු කළ යුතුය. |
| (ඇ) | දේශීය ආදායම් දෙපාර්තමේන්තුවෙන් ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය වෙත ලැබිය යුතු රු.මිලියන 38.2 ක රඳවා ගැනීමේ බදු ශේෂය දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ තොරතුරු සමඟ සැසඳීම් කර නිරවුල් කර ගැනීමට කටයුතුකර නොතිබුණි. | | |
| (ඈ) | ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයේ පවතින රක්ෂණ ක්‍රමය යටතේ වෛද්‍ය බිල්පත් වෙනුවෙන් සේවකයන්ට ගෙවන ලද රු.මිලියනයක මුදල වර්ෂයකට වැඩි කාලයක සිට රක්ෂණ ආයතනයෙන් ප්‍රතිපූර්ණය කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | අදාළ බිල්පත් වල ඇති දෝශ හෝ නියමිත කාලය තුල ක්‍රීඩකයන්/සේවකයන් විසින් අදාල බිල්පත් රක්ෂණ ආයතනය වෙත ඉදිරිපත් නොකිරීම මීට හේතු වී තිබුණි. එම ලැබිය යුතු රක්ෂණ බිල්පත් වලට අදාල මුදල් අදාල ක්‍රීඩකයන්/සේවකයන්ගෙන් අයකර ගැනීමට විධායක කමිටු අනුමැතිය ලැබී ඇත. | අදාල පාර්ශ්ව යන්ගෙන් ලැබිය යුතු මුදල් අප්‍රමාදව අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

### 1.5.2 ගෙවිය යුතු

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වැඩ අවසන් වූ කොන්ත්‍රාත් සඳහා ගෙවිය යුතු රු.මිලියන 15 ක රඳවාගැනීම් මුදල් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. තවද, 2021 වර්ෂයේ පැවති LPL තරඟාවලියේ ජයග්‍රාහකයින් වූ ජැෆ්නා කින්ස් කණ්ඩායමට ලබා දීමට නියමිතව තිබූ රු. මිලියන 6 ක මුදල් වර්ෂයකට වඩා වැඩි කාලයක සිට නොගෙවා පැවතුණි. | මෙම ශේෂයෙන් රු. 1,002,100 ක් 2024 වසරේ මුල් මාස කිහිපය තුල ගෙවා නිදහස් කරන ලදී. සෙසු කොන්ත්‍රාත්කරුවන් අවශ්‍ය ලියවිලි ඉදිරිපත් නොකිරීම මත එම ශේෂයන් ගිණුම් වල රඳවා ඇත. අවශ්‍ය ලියවිලි ඉදිරිපත් නොකලහොත් එම ශේෂයන් ආදායම් ලෙස ගිණුම්ගත කිරීමට කටයුතු කරනු ලැබේ. LPL තරගාවලියේ ත්‍යාග මුදල Jaffna Kings කණ්ඩායමට 2024 ජූලි මස ගෙවීමට කටයුතු සිදුකෙරේ. | ගෙවිය යුතු මුදල් නිරවුල් කිරීම සඳහා ඇති බැඳීම් සොයාබලා ඒවා නිරවුල් කිරීමට හෝ ආදායමට ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | 2023 දෙසැම්බර් 31 දිනට ආපසු ගෙවිය යුතු තැන්පත් රු.මිලියන 1.6 ක් වර්ෂයකට වඩා වැඩි කාලයක සිට නිරවුල් කර නොතිබුණි. | අදාළ පාර්ශව විසින් ලියවිලි බාර නොදුන් නිසා එම ශේෂයන් තවමත් ගිණුම් වල පවතී. එම මුදල් සඳහා ඉල්ලුම් නොකරන්නේ නම් අනුමැතීන් ඇතිව අදායමට ගැනීමට නියමිතය. | |

## 2 මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. මිලියන 2,073.56 ක ඌණතාවයක් වූ අතර, ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු. මිලියන 6,047.51 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. මිලියන 8,121.07 ක පිරිහීමක් නිරීක්ෂණය විය. විදේශ විනිමය අනුපාත ලාභය රු. මිලියන 7,738.35 කින් අඩුවීම සහ ඉකුත් වර්ෂයට වඩා සංවර්ධන වියදම් රු. මිලියන 616.02 කින් වැඩිවීම මෙම පිරිහීම සඳහා ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | කොන්ත්‍රාත් පිරිවැය රු. මිලියන 2.9 ක් වූ ශ්‍රී ලංකා ක්‍රිකට් මූලස්ථාන ගොඩනැගිල්ල නවීකරණ ව්‍යාපෘතිය ආරම්භකර වර්ෂ 03 කට වඩා වැඩි කාලයක් ගතවී තිබුණද මෙතෙක් වැඩ අවසන් කර නොතිබුණි . | ලියකියවිලි සම්පූර්ණ කිරීමෙන් අනතුරුව 2024 වර්ෂයේ දී ප්‍රාග්ධනිත කිරීමට නියමිතය. | වැඩ අවසන් කර ප්‍රාග්ධනිත කිරීමට පියවර ගත යුතුය. |
| (ආ) | කොන්ත්‍රාත් පිරිවැය රු. මිලියන 64.7 ක දීපව්‍යාප්ත මධ්‍ය | ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියේ (CIDA) ඇතුලත් කර්මාන්ත | තාක්ෂණික ඇගයීම් කමිටු නිර්දේශ අනුගමනය |

| | | | |
|---|---|---|---|
| | විකට් (80'x10') සහ පැතිවිකට් (45'x 6') ඉදිකිරීමේ ව්‍යාපෘති සඳහා ඉදිකිරීම් කොන්ත්‍රාත්කරුවන් තෝරා ගැනීමේදී තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් ප්‍රතික්ෂේප කරන ලද ලංසුකරුවන් දෙදෙනෙකු වෙත කොන්ත්‍රාත් ප්‍රදානය කර තිබුණි. | තුලට මෙම Turf Wickets සැකසීමේ කර්මාන්තය ඇතුලත් වී නොමැත. මෙය අප රටට නව කර්මාන්තයක් බිහි කර ඉන් රැකිරක්ෂා බිහිකිරීමේ අරමුණින් ආරම්භ කල නියමු ව්‍යාපෘතියකි. | කරමින් ප්‍රසම්පාදන ක්‍රියාවලිය සිදුකළ යුතුය. |
| (ඇ) | 2024 වර්ෂයේදී ශ්‍රී ලංකාවේ පැවැත්වීමට යෝජිතව තිබූ 19 න් පහළ ලෝක කුසලානය සඳහා ක්‍රීඩාංගන සංවර්ධනය වෙනුවෙන් ක්‍රිකට් සංගම් 04 ක් වෙත රු.මිලියන 460.73 ක් අත්තිකාරම් වශයෙන් ලබා දී තිබුණි. අදාළ කාර්යයන් 2024 ජනවාරි 19 දිනට පෙර නිමකළ යුතු වුවද එකී කිසිදු ව්‍යාපෘතියක් අදාළ කාලය තුල දී නිමකර නොතිබුණි. අදාළ කාර්යයන් ඉටු නොකිරීම නිසා උක්ත මුදලින් රු.මිලියන.195 .1 ක් අදාළ ක්‍රිකට් සංගම් විසින් අත රඳවා ගැනීමෙන් පසු මුදල් ආපසු ලබාදීම නිසා ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයට සිදු වූ මූල්‍ය අලාභය ආසන්න වශයෙන් රු.මිලියන4 .8 කි. 2024 මැයි 31 දින වන විටත් රු.මිලියන 79.73 ක මුදලක් අදාල කාර්යයන් සඳහා යොදවා නොගෙන ඉහත ක්‍රිකට් සංගම් 04 ක් විසින් අත රඳවාගෙන තිබුණි. | ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයේ පරිපාලනයට අමාත්‍යවරයා මැදිහත් වුවහොත් ව්‍යාපෘති අතරමග නවතා දමනු ඇතැයි යන සාධාරණ සැකය මත අදාල ක්‍රීඩා සමාජ 4 විසින් ඇස්තමේන්තුගත මුළු මුදලම අත්තිකාරම් ලෙස ඉල්ලා සිටි අතර ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය විසින් එම ක්‍රීඩා සමාජ වෙත 85%ක අත්තිකාරම් වශයෙන් ලබා දෙන ලදී.<br>අදාල ක්‍රීඩා සමාජ විසින් මුදල් ආපසු බාර දීමේදී ඇති වූ ප්‍රමාදය නිසා ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයට ඇති වූ පොලී අලාභය එම ක්‍රීඩා සමාජ වලින් ආපසු අය කර ගැනීමට විධායක කමිටුව තීරණය කර ඇත. දැනට නිම කර ඇති ඉදිකිරීම් වෙනුවෙන් මුදල් ගෙවීමට එම ක්‍රීඩා සමාජ බැඳී සිටින බැවින් අවශ්‍ය මුදල් ඔවුන්ගේ ගිණුම් වල තබා ගැනීම අත්‍යවශ්‍ය කරුණකි. | ව්‍යාපෘති අදාළ කාලය තුලදී නිමකිරීමට කටයුතු කළ යුතු අතර කාර්යයන් අදාළ කාලය තුලදී ඉටු නොකිරීම නිසා ආයතනයට සිදුවූ මූල්‍ය අලාභයන් අයකර ගැනීමට පියවර ගත යුතුය. |
| (ඇ) | 2023 වර්ෂයේදී විවිධ සංවර්ධන කාර්යයන් සඳහා ක්‍රිකට් සමාජ හා ක්‍රිකට් සංගම් 07 කට සහ පාසල් 03 කට අත්තිකාරම් වශයෙන් ලබාදුන් රු.මිලියන 297.86 ක මුදලින් රු.මිලියන 80.3 කට අදාල කාර්යයන් පමණක් නිමකර තිබූ අතර රු. මිලියන 217.56 ක් වූ ඉතිරි මුදල 2024 මැයි 31 දිනය දක්වාම නිරවුල් කර නොතිබුණි. | ව්‍යාපෘති උපදේශකවරුන්ගේ අධීක්ෂණය යටතේ භෞතික හා මූල්‍යමය ප්‍රගතිය අනුව සහ වැඩ අවසන් කල පසු අත්තිකාරම් නිරවුල් කරගැනීමට ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය කටයුතු කරනු ලැබේ. | අත්තිකාරම් වශයෙන් ලබාදෙන මුදලින් ව්‍යාපෘතිවල වැඩ අවසන් කල පසු භෞතික හා මූල්‍යමය ප්‍රගතිය ගණනය කර අත්තිකාරම් නිරවුල් කරගැනීමට කටයුතු කළ යුතුය. |

### 3.2 ප්‍රමාද වූ ව්‍යාපෘති

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| අ) | අවම ප්‍රේක්ෂක ධාරිතාවය ආසන 40,000 ක් සහිත අංග සම්පූර්ණ ජාත්‍යන්තර ක්‍රිකට් ක්‍රීඩාංගණයක් රු.බිලියන 08 ක ඇස්තමේන්තුගත වියදමකින් දියගම ඉදිකිරීම සඳහා අක්කර 21 ක භූමි භාගයක් ලබාදීමට ක්‍රීඩා හා තරුණ කටයුතු අමාත්‍යාංශය එකඟ වී තිබුණද, මේවන තෙක් එකී කටයුතු සිදුනොවීම නිසා ව්‍යාපෘති ඉදිකිරිම් ආරම්භ කිරීමට නොහැකි වී තිබුණි. අදාළ භූමි ප්‍රමාණය නීත්‍යානුකූල වශයෙන් ලබාදීමට පෙර හා අදාළ පාර්ශ්ව අතර අවබෝධතා ගිවිසුමක් ඇති කර ගැනීමකින් තොරව ව්‍යාපෘතියේ නිර්මාණ හා මැණුම් ගාස්තු වශයෙන් ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය විසින් 2020 වර්ෂයේදී රු. මිලියන 3.4 ක මුදලක් වැය කර තිබුණි. | මීට අදාල ඉඩම, ක්‍රීඩා හා තරුණ කටයුතු අමාත්‍යාංශයට අයිති නොවන බවත් එය ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාව සතුවන බව දැනුවත් වූ අතර ඉඩමේ අයිතිය නිරවුල් කරගැනීම සඳහා කැබිනට් පත්‍රිකාවක් මගින් ඉඩම ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයට විකිණීමේ පදනම මත ලබාදීමට අවශ්‍ය කටයුතු වර්තමාන ක්‍රීඩා අමාත්‍යවරයා විසින් සිදුකෙරෙමින් පවතින බව දන්වා සිටිමු . | පරිපාලන කටයුතු නිසිපරිදි සිදුකර ව්‍යාපෘති ඉදිකිරිම් ආරම්භ කිරීමටත් කටයුතු කළ යුතුය. |
| (ආ) | පොළොන්නරුව ජාතික ක්‍රිකට් ක්‍රීඩාංගණය සහ ප්‍රධාන ප්‍රේක්ෂකාගාර ගොඩනැගිල්ල ඉදිකිරීමේ ව්‍යාපෘතිය සඳහා හෙක්ටයාර 17 ක රජයේ ඉඩම අවුරුදු 30 ක බදු පදනම යටතේ වාණිජ කටයුතු සඳහා ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය වෙත ලබාදීමට අදාළ අමාත්‍යවරයා විසින් 2022 ඔක්තෝම්බර් 28 දිනැති අංක 2304 දරණ ගැසට් පත්‍රය මගින් අනුමැතිය ලබාදී වර්ෂයකට වඩා වැඩි කාලයක් ගත වී තිබුණ ද, අදාළ බදු ගිවිසුම් ගතවීම් සිදුකර නොතිබූ අතර ප්‍රේක්ෂකාගාරයේ ඉදිකිරීම් කටයුතු ද මෙතෙක් සිදුකර නොතිබුණි. ඉදිකිරීම් පිරිවැය රු. මිලියන 154 ක් වූ උක්ත ක්‍රිකට් ක්‍රීඩාපිටියේ 2022 හා 2023 වර්ෂවල නඩත්තු කටයුතු සහ අමතර එකතු කිරීම් සඳහා එකතුව රු. මිලියන 27.5 ක් වැය කර තිබුණි. නමුත්, විගණිත දිනය වූ 2024 ජූනි 30 වනවිටත් | හිඟුරක්ගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් මෙම කටයුත්ත ප්‍රමාද කිරීම නිසා බදු ගිවිසුම් ගතවිම ද ප්‍රමාද වී ඇත. මෙම ක්‍රීඩාංගනයේ ප්‍රථම තරගය 2024 ජුලි මස 18 වන දින ක්‍රීඩා කරමින් ක්‍රීඩාංගනය විවෘත කිරීමට නියමිතය. | පරිපාලන කටයුතු නිසිපරිදි සිදුකර ව්‍යාපෘති ඉදිකිරිම් ආරම්භ කිරීමටත් නිමකර ඇති ක්‍රීඩාංගණය උපයෝජනයට ගැනීමටත් කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | ක්‍රීඩාංගණය උපයෝජනයට ගෙන නොතිබුණි. | | |
| ඇ) | ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය විසින් ඉදිකිරීමට යෝජිත මහනුවර උසස් තාක්ෂණ පුහුණු මධ්‍යස්ථාන ව්‍යාපෘතිය සඳහා මහනුවර ප්‍රදේශයේ අක්කර 1රූඩ් 3පර්චස් 20.2ක ඉඩමක් වර්ෂ 30ක බදු පදනම මත රු.මිලියන 26.5කට 2017අප්‍රේල් 20 දින බදු ගෙන තිබුණි.මෙම ඉඩමෙහි පදිංචිව සිටි පුද්ගලයකු ඉවත් කිරීම සඳහා ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය රු.500,000 ක් ගෙවා තිබූ අතර ඉඩමේ පිඹුරු පත් වල නොගැලපීමක් පවතින තත්ත්වයක් යටතේ භුක්තිය නිරවුල් නොවූ ඉඩමක් සඳහා බදු ගිවිසුමක් ඇති කර ගැනීමට නීතිඥවරයෙකු වෙත රු.525,000 ක් ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය විසින් ගෙවා තිබුණි. 2021 වර්ෂයෙන් පසුව මෙම ව්‍යාපෘතියේ කිසිදු ඉදිකිරීමක් සිදුකර නොතිබූ අතර ඉඩම බදු ගෙන වර්ෂ 06 ක් ගතවෙමින් තිබියදීත් ඉදිකිරීම් මූලික අදියරේ පැවතුණි. | ක්‍රීඩක ක්‍රීඩිකාවන්, නිලධාරීන් සහ අධ්‍යයන කාර්ය මණ්ඩල වලට වඩාත් පහසුවෙන් ළඟාවිය හැකි ස්ථානයක් වූ බැවින් මෙම මධ්‍ය ස්ථානය ඉදිකිරීමට මහනුවර තෝරා ගන්නා ලදි. මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේදී විවිධ අර්බුදකාරී තත්වයන් අත්විඳීමට සිදුවිය. | ව්‍යාපෘති සඳහා ඉඩම් බදු ගැනීමේදී භුක්තිය නිරවුල් ඉඩම් තෝරා ගත යුතු අතර ව්‍යාපෘතියෙන් අපේක්ෂිත අරමුණු ඉටුකර ගැනීම සඳහා කාර්යක්ෂමව කටයුතු කළ යුතුය. |

### 3.3 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ව්ධායක මණ්ඩල අනුමැතිය මත ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය විසින් සම්බන්ධීකාරකවරුන් 44 දෙනෙකු පළාත් මට්ටමින් බඳවාගෙන තිබුණි. සමාලෝචිත වර්ෂය තුළදී ඔවුන් වෙත මාසික දීමනා, උත්සව හා දුෂ්කර දීමනා, ප්‍රවාහන වියදම් ප්‍රතිපූර්ණය කිරීම් ලෙස රු.මිලියන 65.98 ක් ගෙවා තිබුණි. මෙම සම්බන්ධීකාරකවරුන් වෙත දෛනිකව ඉටුකල යුතු කාර්යයන් හඳුනාගෙන පැවරීම් කිරීම් වෙනුවට ඉතා කෙටි කාලයක් තුළ ඉටුකල යුතු එක් කාර්යයක් හෝ කාර්යයන් 02 ක් | සම්බන්ධීකාරකවරුන්ට දෛනික රාජකාරි නොපැවරුවද වර්ෂය මුලදී ඔවුනට පවරන ලද රාජකාරි දිනපතා ඉටුකිරීම් මාසික වාර්ථා මගින් නිරීක්ෂණය කෙරේ.පැවරූ කාර්යයන් ඉටු කිරීමේ දී දරන ලද ප්‍රවාහන වියදම් ප්‍රතිපූර්ණය කිරීම සඳහා මාසික දීමනාවක් ගෙවනු ලබයි. ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයේ කටයුතු සඳහා ඔවුන් කැපකරන කාලය, ඉන්ධන සහ වාහන නඩත්තුව සඳහා දැනට ගෙවන දීමනාව ප්‍රමාණවත් නොවන බව අපගේ විශ්වාසයයි. | දෛනිකව ඉටුකල යුතු කාර්යයන් හඳුනාගෙන එම කාර්යයන් ආයතනයේ කාර්ය මණ්ඩලය යොදවාගෙන ඉටුකර ගතයුතුය. |

| | | | |
|---|---|---|---|
| | පමණක් පවරා තිබීමෙන් ද ඔවුන් දරන නිත්‍ය රාජකාරි තනතුරු පිළිබඳව සොයා බැලීමකින් තොරව, ඉහත පුද්ගලයින් පත්කර ගෙන තිබීමෙන්ද ඔවුන් වෙත ගෙවා තිබූ මුදලට සරිලන සේවාවක් ලබා ගත්තේද යන්න විගණනයේදී නිශ්චය කිරීමට නොහැකි විය. | | |
| (ආ) | 1973 අංක 25 දරන ක්‍රීඩා පනතේ 31 වන වගන්තිය සමග කියවිය යුතු 41 වන වගන්තිය යටතේ ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යවරයා විසින් 2022 දෙසැම්බර් 14 දිනැති අංක 2310/26 දරන අති විශේෂ ගැසට් පත්‍රය මගින් පළ කරන ලද 5(6) රීතියට පටහැනිව දැනටමත් පුත්තලම දිස්ත්‍රික් ක්‍රිකට් සංගමයේ සභාපති ලෙස සහ ශ්‍රී ලංකා අත්පන්දු සම්මේලනයේ ලේකම් ලෙසද කටයුතු කරන පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු වෙත රු. මිලියන 2.2 ක දීමනාවක් සමාලෝචිත වර්ෂය තුළදී පමණක් ගෙවා තිබුණි. | - එම - | ක්‍රීඩා පනත ප්‍රකාරව නිකුත් කරන ලද ජාතික ක්‍රීඩා සංගම් නියෝගවලට අනුකූලව කටයුතු කළ යුතුය. |

**3.4 බදු ප්‍රතිපත්ති වලට අනුකූල නොවීම**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2021 අංක 10 සහ 2022 අංක 45 දරණ දේශීය ආදායම් සංශෝධිත පනත් අනුව ස්වාධීන සේවා සපයන්නකු වෙත සේවා ගාස්තු ගෙවීමකදී සියයට 5ක රඳවා ගැනීමේ බදු (WHT) අඩුකිරීමක් සිදු කළ යුතු බව දක්වා තිබුණි. ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය විසින් ක්‍රිකට් ක්‍රීඩකයින් වෙත 2023 වර්ෂය තුළදී ගෙවා තිබූ ආසන්න වශයෙන් රු.මිලියන 794.45 ක කොන්ත්‍රාත් මුදල් මත හා ක්‍රිකට් විනිසුරුවරුන්, තේරීම්කාරකවරුන්, විස්තර විචාරකයින් සහ උපදේශකවරුන් වෙත ගෙවූ | උක්ත පනත් අනුව ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය කොන්ත්‍රාත් පදනම මත සේවය ලබාගන්නා වෘත්තිකයන් වන ක්‍රීඩකයන්,විනිසුරුවරුන්, තේරීම්කාරකවරුන්, විස්තර විචාරකයන්, උපදේශකවරුන් සහ සම්බන්ධීකාරකවරුන් රඳවාගැනීමේ බද්දට යටත් බවට කිසිදු සටහනක් නොමැති බැවින් ඉහත කොන්ත්‍රාත් පදනම මත සේවය ලබාගන්නා වෘත්තිකයන් රඳවාගැනීමේ බද්දට යටත් නොවන බව දැනුම් දෙමි. | දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් විමසා ඔහුගේ නිශ්කාෂණයක් ලබා ගැනීමට හෝ ඉහත මුදල් මත රඳවා ගැනීමේ බදු අඩු කිරීමට ආයතනයට පවතින බැඳීම් පිළිබඳ තහවුරුවක් කර ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| ගාස්තු මත ඉහත විධිවිධාන ප්‍රකාරව රඳවාගැනීම් බදු අඩුකිරීම් සිදුකර නොතිබුණි. මේ සම්බන්ධයෙන් දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් විමසා ඔහුගේ නිශ්කාෂණයක් ලබා ගැනීමට හෝ ඉහත මුදල් මත රඳවාගැනීමේ බදු අඩු කිරීමට ආයතනයට පවතින බැඳීම් පිළිබඳ තහවුරුවක් කර ගැනීමට හෝ ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය කටයුතු කර නොතිබුණි. එසේම, සම්බන්ධීකාරකවරුන් වෙත සමාලෝචිත වර්ෂයේදී ගෙවන ලද රු.මිලියන 65.98 ක ගෙවීම් සඳහාද අදාල පරිදි බදු අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | | |

**3.5 ආදායම් අහිමිවීම්**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2024 වර්ෂයේ දී ශ්‍රී ලංකාවේ පැවැත්වීමට නියමිතව තිබූ 19 න් පහළ ලෝක කුසලාන තරඟාවලියේ සත්කාරකත්වය අහිමිවීම නිසා ICC Business Corporation FZLLC සමඟ එළඹ තිබූ ගිවිසුම ප්‍රකාරව ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයට ඇ.ඩො මිලියන 2.46 කට සමාන රු. මිලියන 787 ක ආදායමක් අහිමිවී තිබුණි. මෙම හේතුව නිසා මෙකී ලෝක කුසලානය පැවැත්වීමට නියමිතවී තිබූ කාලය තුළ සංචාරක නිකේතන වල වෙන්කරවා ගෙන තිබූ කාමර 700 ක පමණ විදේශ විනිමය ආදායමද, ඒ තුළින් ලැබීමට තිබූ සංචාරක ප්‍රතිලාභද රටට අහිමිවී තිබුණි. | හිටපු ක්‍රීඩා අමාත්‍යවරයාගේ ද්වේශසහගත, අත්තනෝමතික සහ නීතිවිරෝධී ක්‍රියා හේතුවෙන් උක්ත තරගාවලියේ සත්කාරකත්වය අහිමි වීමෙන් ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයට ඇමරිකානු ඩොලර් මිලියන 2.46 ක සෘජු පාඩුවක් සිදු කර ඇත. | ශ්‍රී ලංකාවේ පැවැත්වීමට නියමිත තරඟාවලින්හි සත්කාරකත්වය අහිමිනොවන පරිදි ක්‍රියා කිරීමට අදාල පාර්ශ්වයන් වග බලා ගත යුතුය. |

## 4. ශිණුම්කටයුතුභාවය හා යහපාලනය

### 4.1 සංයුක්ත සැලැස්ම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක | නිර්දේශය |
|---|---|---|
| 2016 ඔක්තෝම්බර් 27 දිනැති | පිළියෙළ කර ඇති සංයුක්ත සැලැස්මෙහි | සංයුක්ත සැලැස්මෙහි සිදු |

| | | |
|---|---|---|
| අංක 1990/23 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය මගින් නිකුත් කර තිබූ සංගම් නියෝගයන්හි III කොටසේ (XI) ප්‍රකාරව ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය විසින් පිළියෙල කර තිබූ සංයුක්ත සැලැස්ම චක්‍රීය පදනමකින් පිළියෙල කර නොතිබුණි. හඳුනාගෙන තිබූ ක්‍රියාකාරකම් වලට අදාල කාලපරිච්ඡේදයන්, අරමුදල් මූලායනය කර ගන්නා ආකාරය සහ අපේක්ෂිත වියදම් පිළිබඳව ඇතුළත්වී නොතිබුණි. | සිදු වියයුතු වැඩි දියුණු කිරීම් සඳහා මේ වන විට ක්‍රියාමාර්ග ගෙන ඇත. | වියයුතු වැඩි දියුණු කිරීම් කිරීමට ක්‍රියාමාර්ග ගත යුතුය. |

## 4.2 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2016 ඔක්තෝම්බර් 27 දිනැති අංක 1990/23 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය මගින් නිකුත් කර තිබූ සංගම් නියෝගයන්හි III කොටසේ (XII) ප්‍රකාරව ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය විසින් පිළියෙල කර තිබූ 2023 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම තුළ ක්‍රියාකාරකම් වල ප්‍රමුඛතා මට්ටම් හඳුනාගෙන නොතිබුණු අතර ක්‍රියාකාරකම් නොවන දෛනික රාජකාරි ස්වරූපයේ කටයුතු ද ඒ තුළ විය. අපේක්ෂිත වියදම් සහ ක්‍රියාකාරකම් ඉටු කිරීමේ නිශ්චිත කාලපරිච්ඡේදයන් ඒ තුළ සඳහන් නොවීය. 2023 වර්ෂය තුළ ඉදිරිපත් කර තිබූ සංශෝධිත අයවැයට සමගාමීව වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මෙහි සංශෝධනයන් සිදු කර නොතිබුණි. | ක්‍රියාකාරී සැලැස්මට අවශ්‍ය වැඩිදියුණු කිරීම් සිදු කිරීම සඳහා උපදේශන සේවා ලබාගැනීමට සැලසුම් කර ඇති අතර එහිදී ක්‍රියාකාරී සැලැස්ම තුලට ඇතුලත් වියයුතු නව කරුණු ඔවුන්ගේ නිර්දේශ පරිදි ඇතුලත් කිරීමට කටයුතු කරනු ලැබේ. | අපේක්ෂිත අරමුණු ඵලදායීව ඉටුකිරීම සඳහා වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම උපයෝගී කරගත යුතුය. |

## 4.3 ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්ම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයේ ප්‍රසම්පාදන අත්පොතෙහි “ ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්ම ” පිළිබඳ වගන්තියක් ඇතුළත් කර නොතිබුණු | ප්‍රසම්පාදන මාර්ගෝපදේශයන් වැඩිදියුණු කර යාවත්කාලීන කිරීම, වඩා ක්‍රමවත්ව හා විනිවිදභාවයක් ඇති කිරීමට අවශ්‍ය නව ක්‍රියාමාර්ග එක් කිරීම සඳහා | ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්ම පිළියෙල කිරීමට කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| බැවින් 2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය අදාළ කරගෙන ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කිරීමට කටයුතු කර නොතිබුණි. | අන්තර්ජාතික විගණන ආයතනයක සේවාව මේ වන විටත් ලබා ගනිමින් පවතී. | |

**4.4 ප්‍රසම්පාදන සැලැස්ම**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2023 වාර්ෂික අයවැය, වර්ෂය තුළ එක් වරක් සංශෝධනයකර තිබූ නමුත් ඊට සමගාමීව වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සංශෝධනය කර නොතිබුණි. 2023 වර්ෂයේ ප්‍රසම්පාදන සැලැස්ම සඳහා ලද විධායක කමිටු අනුමැතිය විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි. | විගණනයෙන් පෙන්වා දී ඇති පරිදි 2023 වර්ෂය තුළ අවශ්‍ය සංශෝධනයන් සිදු නොවූ අතර, 2024 වසරේ සිට අවශ්‍ය සංශෝධනයන් කිරීමට පියවර ගන්නෙමු. | විධායක කමිටු අනුමැතිය ලබා ගත යුතු අතර අයවැය සංශෝධන සඳහා ඊට සමගාමීව වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සංශෝධනය කළ යුතුය. |